# සිංහල විකිපීඩියාව

## 1. හැඳින්වීම

යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස පසු ගිය සිය වසක් පමණ කාලය තුළ ලෝකය තාක්ෂණික වශයෙන් සීඝ්‍රයෙන් දියුණු විය. විශේෂයෙන් අද අප ජීවත් වන 21 වන සියවස හඳුන්වන්නේ තොරතුරු තාක්ෂණ යුගය වශයෙනි. මේ යුගයේ දිනකට ලොව පුරා නිපදවෙන තොරතුරු ප්‍රමාණය සුවිශාල ය. මෙසේ නිපදවෙන තොරතුරුවලින් ප්‍රමාණයක් දැනුම බවට පත් වන අතර එම දැනුම නූතන මිනිසා සතු වටිනා ම සම්පත ය. "දැනුම බලය වේ" යැයි ෆ්‍රැන්සිස් බේකන් පඬිවරයා කීවේ එහෙයිනි. මිනිසා විසින් එම තොරතුරු සහ දැනුම ඒකරාශී කොට සංරක්ෂණය කිරීම පිණිස විශ්වකෝෂ නිපදවූ අතර එහි වඩාත් සංවර්ධනාත්මක පියවරක් ලෙස සයිබර් අවකාශයේ විශ්වකෝෂයක් ලෙස විකිපීඩියාව අරඹන ලදි.

## 2. විකිපීඩියාව

ලොව නොයෙක් විෂය පිළිබඳ දැනුම් සම්භාරයක් අන්තර්ගත අකාරාදීගත මහා ග්‍රන්ථ විශ්වකෝෂ යනුවෙන් හැඳින්වේ. බ්‍රිටැනිකා විශ්වකෝෂය සහ සිංහල විශ්වකෝෂය නිදසුන් ය. නූතන තාක්ෂණික දියුණුව සහ අන්තර්ජාල ව්‍යාප්තියත් සමග සබැඳි (online) විශ්වකෝෂ ද බිහි විය. එන්කාටා සහ බ්‍රිටැනිකා විශ්වකෝෂ ලොව ප්‍රමුඛ පෙළේ සබැඳි විශ්වකෝෂ වේ. කෙසේ වුව ද එම පහසුකම ලබා ගැනීමට යම් මිලක් ගෙවීමට සිදු විය.ඊට විසඳුම් සෙවූ ඇමරිකානු ජාතික ජිමී වේල්ස් සහ ලැරී සැංගර්ගේ සංකල්පයක් අනුව සැමට නිදහසේ තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍රයක් ලෙස විකීපීඩියාව 2001 ජනවාරි මස ඇරැඹිණි. 2008 අගෝස්තු වන විට එය භාෂා 264 යුතු ලිපි කෝටියකට වඩා ඇති අන්තර්ජාලයේ වේගයෙන් ම වර්ධනය වන විශ්වකෝෂය බවට පත්ව තිබිණි. ශ්‍රේණිගත කිරීම් අනුව ලොව වැඩි දෙනෙකු පිවිසෙන මුල් වෙබ් අඩවි 10 අතරට විකීපීඩියාව එක් වීමෙන් ඊට ඇති පිළිගැනීම, ජනප්‍රියතාව සහ විශ්වාසය හෙළි වේ. නොමිලේ තොරතුරු ලබා ගත හැකි වීම, නිරතුරුව නව තොරතුරු එකතු වීම, ඕනෑ ම කෙනෙකුට සංස්කරණය කළ හැකි වීම සහ විවිධ භාෂාවලින් සමන්විත වීම සෙසු විශ්වකෝෂ හා සසඳන කල මෙහි ඇති විශේෂතා ය.

ශ්‍රී ලාංකිකයින්ට වඩාත් සමීප ජාත්‍යන්තර බස ඉංග්‍රීසිය නිසා ඔවුන් අතර ප්‍රචලිත වූයේ ඉංග්‍රීසි විකීපීඩියාව ය. එය පරිශීලනයට ඉංග්‍රීසි බස පිළිබඳ යම් පිරිවයක් අවැසි ය. එහෙත් මෙරට ඉංග්‍රීසි සාක්ෂරතාව 10%කි. එහෙයින් මෙරට 90%ක් වන ඉංග්‍රීසි සාක්ෂරතාව අහිමි පිරිසට ඉංග්‍රීසි විකීපීඩියාවෙන් පලක් නොමැත. කෙසේ වුව ද මෙරට ස්වභාෂා සාක්ෂරතාව 91%කි. එහෙයින් සිංහල බසින් විකීපීඩියාවක් පවත්වා ගෙන යන්නේ නම් ඉන් සුවිශාල පිරිසකට ප්‍රයෝජන ලද හැකි ය. අන්තර්ජාලයේ සිංහල අන්තර්ගතය වැඩි කිරීම මගින් 10%ක් වන පරිගණක සාක්ෂරතාව ද වැඩි කරගත හැකි ය.

## 2.1 සිංහල විකිපීඩියාව




රූපය 2.1.1: සිංහල සහ ඉංග්‍රීසි විකිපීඩියාවල මුල් පිටු

මෙවන් බොහෝ ප්‍රයෝජන නිසා සිංහල විකිපීඩියාව 2004 වසරේ ආරම්භ කෙරිණි. එහෙත් එහි වර්ධනය ආරම්භයේ දී සිදු නොවූ තරම් ය. විශේෂයෙන් සිංහල විකිපීඩියාවේ ප්‍රථම ලිපිය පළවෙන්නේ එහි ආරම්භයෙන් මාස 18ට පසු ය. එනම් 2004 ජනවාරි මස ඇරඹෙන විකිපීඩියාවේ මුල් ලිපිය පළවෙන්නේ 2005 ජුලි මස ය. විකිපීඩියාව තොරතුරු හා දැනුම් මූලාශ්‍රයක් ලෙස මෙරට සමාජයේ ප්‍රචලිත නොවීම, දේශීයකරණ අවශ්‍යතාව නොතැකීම සහ පරිගණක හා අන්තර්ජාල සාක්ෂරතාව අවම වීම ආදිය ඊට හේතු වූවා විය හැකි ය.
කෙසේ වුව ද මේ වන විට ක්‍රමයෙන් සිංහල විකිපීඩියා ලිපි ප්‍රමාණය වර්ධනය වෙමින් පවතී. ලොව සියලු විකිපීඩියා එහි ඇතුළත් ලිපි ප්‍රමාණය අනුව අවරෝහණ ක්‍රමයට වර්ගීකරණය කළ හොත් ඉංග්‍රීසි විකිපීඩියාව පළමු තැනට ද සිංහල විකිපීඩියාව 160 වන තැනට පත් වේ. 2008 අගෝස්තු මස වන විට එහි ලිපි 764ක් තිබිණි. එම ලිපි කලාව, විද්‍යාව, ඉතිහාසය, සමාජය සහ චරිතාපදාන ආදි විවිධ ක්ෂේත්‍ර අළලා ලියැවී ඇත. තව ද එම ලිපි 38,850 වරක් සංස්කරණය කෙරී ඇත. ලිපි සැපයීමෙන් සහ සංස්කරණයෙන් සම්පත් දායකයෝ 1065 දෙනෙක් සිංහල විකිපීඩියාව ප්‍රවර්ධනයට සහභාගී වූහ. [1]

## 2.2 සිංහල විකිපීඩියාවේ වැදගත්කම?

මෙසේ සාමූහික වැයමක ප්‍රතිඵලයක් ලෙස වේගයෙන් ගොඩ නැඟෙන සිංහල විකිපීඩියාව නුදුරු අනාගතයේ දී බොහෝ සිංහල විද්‍යාර්ථීන් දැනුම සොයා යන ප්‍රමුඛ මූලාශ්‍රයක් බවට පත්වනු ඇත. සෙසු විකිපීඩියා ජනප්‍රියවීමට හේතු වූ නොමිලේ පරිශීලන හැකියාව, පහසුවෙන් විමර්ෂණය කළ හැකිවීම, ඕනෑම කෙනෙකුට සංස්කරණය කළ හැකිවීම, නිරතුරුව අලුත් වීම සහ විවිධ භාෂා සංස්කරණ තිබීම ආදි හේතු එහි ජනප්‍රිතාවට ද හේතු වනු ඇත.

## 2.3 සිංහල විකිපීඩියාවට දායක වීම

විකිපීඩියාව ලොව පුරා මිනිසුන්ගේ සාමූහික ශ්‍රම දායතක්වයෙන් ගොඩනැඟෙන සම්පතකි. එහි ප්‍රවර්ධනය පිණිස නොමිලේ සිය සේවය ලබාදෙන පිරිස අතිමහත් ය. සිංහල විකිපීඩියාව ද අපගේ සාමූහික වැයමින් වර්ධනය කල යුතු ය. සිංහල විකිපීඩියාව ප්‍රවර්ධනයට ඔබට ද දායක විය

[1] http://si.wikipedia.org/wiki/විශේෂ:සංඛ්‍යාන_දත්ත

හැකි ය. ඒ සඳහා අනුගමනය කෙරෙන්නේ සෙසු විකිපීඩියාවලදී අනුගමනය කරන ක්‍රමවේදයම ය. ඉන් කිහිපයක් පහත දැක්වේ.

- නව මාතෘකාවකින් ලිපියක් ලිවීම
- දැනට පවතින ලිපි සංස්කරණය
- ලිපි ආකෘතියකට සකස් කිරීම
- ලිපි හා උපදෙස් පරිවර්තනය කිරීම

# 3. විකිපීඩියා ලිපියක් ලිවීම

විකිපීඩියාව පොදු ඒකමිතියක් සහිතව පවත්වා ගෙන යාම සඳහා එහි ඇතුළත් ලිපි එක්තරා නිශ්චිත රීති මාලාවක් යටතේ ලියැවීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන් විශ්වකෝෂ ලිපියක් සම්පාදනයේදී අනුගමනය කරන ආචාර ධර්ම පද්ධතියක් විද්වතුන් අතර ප්‍රචලිතව තිබේ. විකිපීඩියාව ද අන්තර්ජාලයේ පවතින විශ්වකෝෂයක් හෙයින් එම සම්ප්‍රදාය විකිපීඩියාව විෂයෙහි ද එලෙසින් ම වලංගු වේ. විකිපීඩියා ලිපියක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සඳහා කෙරෙන මඟපෙන්වීමක් ලෙස ලිපියේ විෂය ක්ෂේත්‍රය, මාතෘකාව හා එහි ඇති වැදගත්කම පිළිබඳ සලකා බලමු.

## 3.1 විකිපීඩියා ලිපියක ලක්ෂණ

**ලිපිය පොදුවේ වැදගත් මාතෘකාවක් වීම:**
ලිපියේ විෂය ක්ෂේත්‍රය පොදු වැදගත්කමක් සහිත විය යුතු ය. හුදු පුද්ගලානුබද්ධ තොරතුරක් නොවිය යුතු ය. නිදසුන් ලෙස මේ මාතෘකා සසඳන්න.

- *ඔබේ ගමෙහි ක්‍රීඩා පිටිය* සහ *දඹුල්ල අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණය*
- *ඔබේ මිතුරාගේ නම* සහ *ජවහල්ලා නේරු*
- *ඔබේ පාසැල් වත්ත* සහ *පේරාදෙනිය උද්භිද උද්‍යානය*

අප විකිපීඩියාවට ඇතුළත් කළ යුත්තේ දඹුල්ල ක්‍රීඩාංගණය, ජවහල් ලාල් නේරුතුමා සහ පේරාදෙනිය උද්භිද උද්‍යානය ආදී පොදු වැදගත්කමක් සහිත තොරතුරු ය. ඔබේ මිතුරා, ගමේ පාසැල සහ ගමේ ක්‍රීඩා පිටිය ඔබට සහ සීමිත පිරිසකට වැදගත් විය හැකි මුත් එම තොරතුරුවල පොදු වටිනාකමක් නැත. ඒ අනුව පොදුවේ සැමට වැදගත් මාතෘකා මොනවාදැයි ඔබට පහසුවෙන් හඳුනාගත හැකි ය.




රූපය 3.1.1 : දැනට ලියා ඇති ලිපි කීපයක්

**සුදුසු මාතෘකාව තෝරාගැනීම:**
ඔබ ලියූ ලිපියට උචිත මාතෘකාවක් යෙදීම තවත් වැදගත් කරුණකි. ඒ මාතෘකාව ලිපියේ අන්තර්ගතය හකුළුවා දක්වන එකක් විය යුතු ය. ඊට වර්ණනාත්මක සාහිත්‍ය ලක්ෂණ මෙන් ම විග්‍රහ ආදී පුද්ගලික අදහස් ඇතුළත් නොවිය යුතු ය.

නිදසුන් ලෙස මේ මාතෘතා සසඳන්න.
- *සීගිරිය* සහ *ලොවක් මවිත කළ සීගිරිය*
- *පේරාදෙණිය උද්භිද උද්‍යානය* සහ *අසිරිමත් පේරාදෙණිය උද්භිද උද්‍යානය*
- *ආර්ථික විද්‍යාව* සහ *ආර්ථික විද්‍යාව පිළිබඳ විග්‍රහයක්*

මේ අතරින් විකිපීඩියාවට සුදුසු මාතෘකා වන්නේ සීගිරිය, පේරාදෙනිය උද්භිද උද්‍යානය සහ ආර්ථික විද්‍යාව ආදී ඒවා බව හඳුනාගත යුතු ය.

## 3.2 අන්තර්ගතය

ලිපියේ අන්තර්ගතය පාඨකයාට පහසුවෙන් අවබෝධ කර ගත හැකි විය යුතු ය. එමෙන් ම පාඨක විශ්වාසය ඇති වන ලෙස තර්කානුකූලව ලිපිය රචනා විය යුතු ය. ඒ සඳහා සැලකිලිමත් විය යුතු සාධක කිහිපයකි.

**ව්‍යාකරණ සහ අක්ෂර වින්‍යාසය:**
ලේඛනයක අදහස් ප්‍රකාශ කෙරෙන්නේ ලිඛිත අකුරු වචන හා වාක්‍යවලිනි. භාෂාවේ අකුරු වචන හා වාක්‍ය ලිවීමේ පොදු සම්මුති හෙවත් රීති ඇත. ඒ ව්‍යාකරණ සහ අක්ෂර වින්‍යාස රීති ය. එම රීති කෙරෙහි සැලකිලිමත් වීම සාර්ථක ලිපියක ආරම්භයයි.

**රචනා ශෛලිය:**
ලිපිය රචනා විය යුත්තේ විකිපීඩියාවේ ගුණාත්මක බව රැකෙන පරිදි ය. එය තොරතුරුවලට සීමා විය යුතු අතර විග්‍රහ කිරීම් අපේක්ෂා නොකරයි. විග්‍රහ කිරීම් පුද්ගල මත ලිපියේ ගුණාත්මකභාවය හීන කරයි.

**අන්තරගත තොරතුරු**
පරිශීලකයාට අන්තර්ගත කරුණු සත්‍ය බව පසක් විය යුතු ය. ඒ සඳහා ලිපිය ලිවීමට යොදාගත් මූලාශ්‍ර සහ උපුටා දැක්වීම් මූලාශ්‍ර සඳහන් කිරීම වැදගත් ය.

## 3.3 ලිපියේ ආකෘතිය

**ලිපියේ ආරම්භය:**
ලිපිය ආරම්භයේ දී පාඨකයාට එහි අන්තර්ගතය පිළිබඳ අදහසක් ලබා දීම වැදගත් ය.

**තොරතුරු පෙළගැසීම:**
මාතෘකාවට අදාළව තොරතුරු පෙළ ගස්වනුයේ රචකයා විසිනි. එමගින් රචකයාට තොරතුරු විස්තර කිරීම පහසු කෙරෙන අතර විශේෂයෙන් පාඨකයාට ලිපියේ අන්තර්ගතය තේරුම් ගැනිම පහසු කෙරෙයි. ඒ සඳහා උප මාතෘකා සහ ඡේද අවශ්‍ය පරිදි භාවිත කළ හැකි ය.

**පිංතූර භාවිතය:**

ලිපියේ සාකච්ඡා කෙරෙන කරුණු පාඨකයා වෙත හොඳින් සන්නිවේදනය කරනු පිණිස පින්තූර භාවිත කළ හැකිය. එසේ ම එමගින් ලිපියට ආකර්ෂණීයත්වයක් ලබා දිය හැකි ය. ඒ නිසා ලිපියක් සැකසීමේ දී ඊට අදාළ පිංතූර යෙදීම ද වැදගත් ය.




රූපය 3.3.1: ඉසුරුමුණිය පිළිබඳ ලිපියේ පින්තූර භාවිතය

**විකිපීඩියාව තුළ ඇති අනෙකුත් ලිපි හා සබැඳිම:**

යම් විෂයකට අදාළ ලිපියක් ලිවීමේදී ඊට සම්බන්ධ පාරිභාෂිත පද විස්තරාදිය දැක්වීම පාඨකයාට ප්‍රයෝජනවත් විය හැකි ය. එහෙත් මේ සියලු විස්තර ලිපියට ඇතුළත් කිරීම ලිපියේ ගලායාමට බාධාවක් විය හැකි ය. ඉන් ලිපිය මාතෘකාවෙන් පිටපැන, ගුණාත්මක බව පිරිහී, ව්‍යාකූලත්වයක් මතුවීය හැකි ය.

ඒ නිසා අදාළ පාරිභාෂිත වචනය හෝ විශේෂයෙන් පැහැදිළි කළ යුතු සංකල්පය වෙනත් ලිපියක පැහැදිළි කර මෙම ලිපියට සබැඳීමක් ලබාදිය හැකි ය. ඊට අදාළ ලිපියක් දැනටමත් පවතී නම් ඊට සබැඳීමක් ලබා දිය හැකි ය. එමගින් ලිපියට අවශ්‍ය සියලු තොරතුරු ඇතුළත් කිරීමටත් ලිපිය සංක්ෂිප්තව සහ මාතෘකාවට අනුකූලව පවත්වාගෙන යාමටත් අවස්ථාව ලැබේ.

**තොරතුරු නිවැරදි බව සහතික කිරීම:**

ලිපිය ලිවීමට යොදාගත් මූලාශ්‍ර සඳහන් කිරීම අත්‍යාවශ්‍ය ය. ඒ සඳහා ඔබ ලිපිය ලිවීමට භාවිත කළ මූලාශ්‍ර (පොත්,වෙබ් අඩවි සහ වෙනත් දේ) දැක්වීමට වගබලා ගන්න. නැතහොත් පාඨකයා ඔබේ ලිපිය කෙරෙහි විශ්වාසය නොතබනු ඇත.

# 4. විකිපීඩියාවට ලිපියක් එක් කිරීම

අප විසින් සකසාගත් ලිපිය ආකර්ශනීය ලෙස විකිපීඩියාවට ඇතුළත් කළ යුතු ය. එය පාඨකයාට තොරතුරු ලබාගැනීමට පහසුවෙයි. ඒ සඳහා ලිපිය පිළිවෙළට සහ සම්මත ආකාරයට සැකසීම වැදගත් ය. ලිපිය මැනවින් සකසා ගැනීමට පරිශීලකයාට පහසුවෙන් හැසිරවිය හැකි මෙවලම් කිහිපයක් ද තිබේ. එම මෙවලම් භාවිතයෙන් කළ හැකි සංස්කරණ කටයුතු කිහිපයක් පහත දැක්වේ.

## 4.1 විකිපීඩියාවේ බහුලව භාවිත වන ලිපි ආකෘතියක්

මෙම ලිපියේ ,

- පින්තූර
- ඡේද
- සබැඳි
- පෙළ සැකසුම
- මූලාශ්‍ර සඳහන් කිරීම
- ලිපියේ ප්‍රධාන අංග

හඳුනාගන්න.




රූපය 4.1.1: විකිපීඩියාවේ භාවිත වන ලිපි අකෘතියක්

## 4.2 විකිපීඩියාව තුළ ඔබේ ලිපිය පළ කිරීම.

**විකිපීඩියාවට ලිපියක් ඇතුළත් කිරීම සඳහා** ඔබ දැනගත යුතු සරළ කරුණු කිහිපයක් සහ සම්මත ක්‍රමවේදයක් තිබේ.

ඔබ ප්‍රථම වතාවට විකිපීඩියාවට දායක වන්නෙකු නම් පහත ක්‍රියා පිළිවෙළ අනුගමනය කරන්න.

❶ විකිපීඩියාව වෙත පිවිසීම

❷ විකිපීඩියාවේ සාමාජිකයකු වීම

❸ අපේක්ෂිත මාතෘකාව දැනටමත් ලියා ඇතිදැයි සොයා බැලීම

❹ නව ලිපිය විකිපීඩියාවට එක් කිරීම

❺ ලිපිය ක්‍රමවත්ව සැකසීම සඳහා විකිපීඩියාවේ සංස්කරණ මෙවලම් භාවිතය

ඉහත කරුණු පිළිබඳ අවබෝධයක් ලද පසු ඔබට ඉතා පහසුවෙන් විකිපීඩියාව සමග කටයුතු කළ හැකි ය.

## ❶ විකිපීඩියාව වෙත පිවිසීම.

එදිනෙදා කටයුතු සඳහා පරිගණක භාවිතයේ දී විවිධ පරිගණක යෙදුම් (Applications) භාවිත කිරීමට සිදු වේ. ලේඛන කටයුතු සඳහා MS Word ද ගීත ඇසීම හා චිත්‍රපට නැරඹීම සඳහා Media Player ද සිතුවම් ඇඳීම සඳහා MS Paint ද මෙසේ භාවිත වන යෙදුම් අතර වේ.

මේ අයුරින් ම අන්තර්ජාලයට පිවිසීමේ දී අන්තර්ජාල ගවේෂකය (Web Browser) නම් යෙදුම භාවිත වේ. මෙවැනි අන්තර්ජාල ගවේෂක කිහිපයක් ඇති අතර Internet Explorer, Mozilla Firefox, Opera යනු ඉන් කිහිපයකි. ඉදිරියේ දී මේ සැසියේ පහසුව සඳහා Internet Explorer ගවේෂකයේ තිර සටහන් රූ (screen shots) පමණක් නිදසුන් ලෙස ඉදිරිපත් කෙරෙනු ඇත.



රූපය 1.0: Windows XP මෙහෙයුම් පද්ධතියක වෙබ් ගවේශයක මෙනුවෙන් තේරීම.

ඔබේ අන්තර්ජාල සම්බන්ධය නිසි සේ ක්‍රියාත්මක වේ නම් ඊ ළඟට පහත (රූපය 1.2) දැක්වෙන ආකාරයේ තිර සටහනක් (screen shot) පරිගණක තිරයේ දිස් වනු ඇත.




රූපය 1.1: පෙරනිමියෙන් Google නම් වෙබ් සෙවුම් යන්ත්‍රය දිස්වන ඇයුරු

දැන් විකිපීඩියාවට පිවිසීම සඳහා ගවේශකයේ ලිපින තීරුවේ www.si.wikipedia.org යොදා වෙබ් පිටුවට යාමට විධානය දෙන්න.




රූපය 1. 2: ගවේශකයේ ලිපින තීරුව මත සිංහල විකිපීඩියාවේ ලිපිනය ඇත

ඉ න් පසු

ඔබ සිංහල විකිපීඩියාවේ මුල් පිටුව වෙත යොමු කෙරෙනු ඇත.




රූපය 1.3: සිංහල විකිපීඩියාවේ මුල් පිටුව

## ❷ විකිපීඩියාවේ සාමාජිකයකු වීම

විකිපීඩියාවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා මුලින් ම පරිශීලක ගිණුමක් සකසා ගත යුතු ය. එමගින් වෙනත් භාෂාවලින් ඇති විකිපීඩියා සහ ඒ හා සම්බන්ධ ව්‍යාපෘති තුළ ද කටයුතු කිරීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත.

පළමුව විකිපීඩියා ගිණුම සකසා ගැනීම සඳහා ප්‍රවිෂ්ට වෙන්න. රූපය 2.1 දක්වා ඇති **ප්‍රවිෂ්ට වන්න/ගිණුමක් තනන්න** ස්ථානය මත ක්ලික් කිරීමෙන් පිවිසිය හැකි ය.




රූපය 2.1: මුල් පිටුවෙහි අතුරුමුහුණතක්

ඒ සමඟ ම විවෘත වන නව පිටුවෙහි **ගිණුමක් තැනීම** සඳහා වන සබැඳිය ක්ලික් කරන්න.




රූපය 2.2: විකිපීඩියාවට පිවිසීමට හෝ ගිණුමක් තැනීමට ඇති පිවිසුම

එමගින් විවෘත වන පිටුව නව පරිශීලක ගිණුමක් සෑදීම සඳහා ය. ඒ සඳහා විමසන තොරතුරු ලබා දෙන්න.



රූපය 2.3: නව පරිශීලක ගිණුමක් සැකසීම සඳහා ඇති වෙබ් පිටුව

✍ අදාළ තොරතුරු ලබා දී පහළින් ඇති **ගිණුමක් තනන්න** විධාන බොත්තම ක්ලික් කරන්න.

## ❸ අපේක්ෂිත මාතෘකාව දැනටමත් ලියා ඇත්දැයි සොයා බැලීම

නව ලිපියක් විකිපීඩියාවට එක් කිරීමට ප්‍රථම එය දැනටමත් විකිපීඩියාවේ ඇත්දැයි සොයා බැලිය යුතු ය. ඒ විෂයට අදාළ ලිපියක් දැනටමත් ලියා ඇත්නම් එහි අන්තරගතය හා සසඳා ඔබ සතු තොරතුරු එයට එක් කළ හැකි ය. නැතිනම් අලුතින් ඇරඹිය හැකිය.

ලිපිය දැනටමත් පවතී ද යන්න සොයා බැලීමට ඔබ අපේක්ෂා කරණ ලිපියේ නම/ශීර්ෂය පහත රූපයේ පෙනෙන පරිදි විකිපීඩියාව තුළ ඇති සෙවුම් යන්ත්‍රය උපයෝගී කරගෙන සොයන්න.




රූපය 3.1: සෙවුම් යන්ත්‍රය වම් පසින් පිහිටවා ඇත

ඔබ සෙවූ ලිපිය දැනටමත් පවතී නම් සෙවුම් යන්ත්‍රය මගින් එය ඔබට ලබා දෙනු ඇත.

එවන් ලිපියක් නොමැති නම් පහත රූපයේ (රූපය 3.2) පරිදි ලිපිය නොමැති බවත් එය ආරම්භ කිරීමට අවස්ථාව ඇති බවත් දක්වයි.




රූපය 3.2: සෙවූ ලිපියක් දැනට නොපවතින බව දක්වන තිර රූප සටහන

# ❹ නව ලිපිය විකිපීඩියාවට එක් කිරීම

නව ලිපිය විකිපීඩියාවට එක් කිරීමට පළමුව ඔබ ඔබේ පරිශීලක ගිණුමට පිවිසෙන්න. ඉන් අනතුරුව උපදෙස් අංක ❸හි සිදු කළ පරිදි ලිපියේ මාතෘකාව සෙවුම් යන්ත්‍රයේ සටහන් කර සොයන්න. එහි ප්‍රතිඵලය සේ ලැබෙන(ලිපිය නොමැති බව සහ ආරම්භ කළ හැකි බව පැවසෙන සබැඳිය) සබැඳිය ක්ලික් කිරීමෙන් ලිපිය ආරම්භ කළ හැකි ය.

උදාහරණයක් ලෙස **පරිසරය** යන නමින් ලිපියක් පවතී දැයි සොයා ලිපිය ආරම්භ කළ අයුරු පහත දැක්වේ.

පළමුව ලිපිය සෙවීම




රූපය 4.1: සෙවුම් යන්ත්‍රයෙන් ලිපිය සෙවීම

"පරිසරය" මාතෘකාවට අදාළව ලැබුණු සෙවුම් ප්‍රථිඵලය




රූපය 4.2: පරිසරය නමින් කළ සෙවුමේ ප්‍රථිඵල

මෙහි (රූපය 4.2) පරිසරය නමින් ලිපියක් නොමැති බවත් එනමින් ලිපියක් පළ කළ හැකි බවත් පැවසෙයි.

එසේ ලැබෙන පණිවුඩයේ රතු වර්ණයෙන් (පරිගණක තිරයේ) දැක්වෙන සබැඳිය හරහා නව ලිපිය පළකිරීමට අවස්ථාව සලසා දෙයි.




රූපය 4.3: ලිපිය ආරම්භ කළ හැකි සබැඳි

සබැඳි මත ක්ලික් කිරීමෙන් ලිපිය අරඹන්න.




රූපය 4.4: ලිපියේ සංස්කරණ අවස්ථාව

මෙසේ ඇරඹෙන්නේ ලිපියේ සංස්කරණ අවස්ථාවයි. දැන් ලිපිය ගෙනවිත් **සංස්කරණ කළාපයට** අතුළත් කරන්න.

පහත රූපයේ දැක්වෙන්නේ **සංස්කරණ කළාපයට** ඇතුළත් කළ පෙළක තිර රූප සටහනයි.




රූපය 4.5: "පරිසරය" ලිපිය සඳහා අන්තර්ගතය එක් කර ඇත

සංස්කරණ අවස්ථාවේ ඇති ලිපිය විකිපීඩියාව තුළ සුරැකීම කළ යුතු ය. ඒ සඳහා සංස්කරණ කළාපයට පහළින් ඇති විධාන බොත්තම් (රූපය 4.6) භාවිත කරන්න.




රූපය 4.6: සංස්කරණ අවස්ථාවේ ඇති විධාන බොත්තම්

- **පිටුව සුරකින්න** මගින් අන්තර්ගතය විකිපීඩියාව තුළ සුරැකීම සිදු කෙරේ.
- **පෙරදසුන පෙන්වන්න** මගින් තාවකාලිකව ලිපිය සුරැකි විට පෙනෙන ආකාරය පෙන්වීම සිදු කෙරෙයි.
- **වෙනස්වීම් පෙන්වන්න** මෙමගින් පෙර තිබූ ලිපිය හා සංශෝධිත ලිපිය අතර ඇති වෙනස්කම් පෙන්වයි.
- **අවලංගු කරන්න** මගින් ලිපිය සුරැකීමකින් තොරව සංස්කරණ අවස්ථාවෙන් ඉවත්වීම සිදු කෙරෙයි.

අප උදාහරණයේ සුරැකි අවස්ථාව පහත රූපයේ (රූපය 4.7) දැක්වේ.




රූපය 4.7: පරිසරය නමින් ලියවුණු ලිපිය

ඉහත දැක්වෙන්නේ “පරිසරය” නමැති ලිපිය විකිපීඩියාවට එක් කළ අවස්ථාව ය. විකිපීඩියාවට ලිපියක් එක් කිරීම සඳහා අප අනුගමනය කළ යුතු ක්‍රමවේදය මෙයයි.